# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2376/22 – 2024 මාර්තු මස 20 වැනි බදාදා – 2024.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, දේවාලදෙනිය (භූ.මු.පි. 20) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Ma/LGG/2018/441 හා 2019.06.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** – වට්ටක්කායාය සහ බතලයාය – **ප්‍රමාණය: හෙක්. 3.4231**

උතුරට: කෝනාර මුදියන්සේලාගේ වත්තේ ගෙදර වජිර චානක හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය සහ මා ඔය; නැගෙනහිරට: හිමිකම් කියන්නා නොදන්නා මාතුවාගල සහ ඩබ්ලිව්. ජී. නිමල් කරුණාරත්න හිමිකම් කියන මාතුවාගල; දකුණට: ඩබ්ලිව්. ජී. නිමල් කරුණාරත්න හිමිකම් කියන මාතුවාගල, කැබලි අක්ෂර බී සහ පහලගෙදර සිරිසෝම හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය; බටහිරට: කෝනාර මුදියන්සේලාගේ ලලිත් වසන්ත කෝනාර හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය සහ කෝනාර මුදියන්සේලාගේ වත්තේ ගෙදර වජිර චානක හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය.

02. කැබලි අක්ෂර **'B'** – වට්ටක්කායාය සහ බතලයාය – **ප්‍රමාණය: හෙක්. 2.2983**

උතුරට: කෝනාර මුදියන්සේලාගේ ලලිත් වසන්ත කෝනාර හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: ඩබ්ලිව්. ජී. නිමල් කරුණාරත්න හිමිකම් කියන මාතුවාගල; දකුණට: ඩබ්ලිව්. ජී. නිමල් කරුණාරත්න හිමිකම් කියන මාතුවාගල සහ කේ. එම්. හීන්බණ්ඩා හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය; බටහිරට: පහලගෙදර සිරිසෝම හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: LD/05/2010/MV/52-B.
2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 - 0160


1A – G 041624 – 14 (2024/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*